කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී ප්‍රථම වසර පරීක්ෂණය
දෙවන සෙමෙස්තරය - 2019/2020

# FND 1212 – සිංහල ලේඛන සම්ප්‍රදාය හා සන්නිවේදනය

(පැ දෙකයි)

ප්‍රශ්න **හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

---

01. අමාවතුර හා බුත්සරණ යන කෘතිවල ලේඛන රීතියෙහි දැකගත හැකි සමවිෂමතා සාකච්ඡා කරන්න.

02. සිංහල ගී කාව්‍ය සඳහා උපයුක්ත කර ගැනුණු භාෂාවෙහි විශේෂ ලක්ෂණ කවරේදැයි සනිදර්ශනව විමසන්න.

03. "දහනවවන සියවසේ සිංහල ගද්‍ය ආඛ්‍යානවල භාෂාව සකස්වීමෙහි ලා සද්ධර්මාලංකාරය උපකාරී විය" මේ ප්‍රකාශය විමසන්න .

04. "පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි භාෂාවලින් එක්කර ගැනුණු තත්සම පදවලින් ද සිංහල වාක්කෝෂය පෝෂණය වී ඇත." නිදසුන් ඇසුරින් විමසන්න.

05. පන්සිය පනස් ජාතක පොතේ භාෂා රීතියෙහි විශේෂ ලක්ෂණ සනිදර්ශනව විවරණය කරන්න.

06. "විසිවන සියවසේ සිංහල භාෂා ව්‍යවහාරයේ කැපී පෙනෙන වැදගත්ම ලක්ෂණය වන්නේ, ලේඛන රීති විවිධත්වය යි." විමසන්න.

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් (02) තෝරාගෙන කෙටි සටහන් ලියා දක්වන්න.

    I. සිංහල ප්‍රාකෘත යුගය
    II. හෙළ හවුල
    III. රීතිය හා ශෛලිය
    IV. සිංහල නවකථා භාෂාව

*********************